රහස්‍ය ලේඛනයකි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි


# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව


## පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය


## 2025


# උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

## I පත්‍රය








සියලු ම හිමිකම් ඇවිරිණි.

සංශෝධනවලට යටත් ය.


**විශේෂ උපදෙස් :-** එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුරට හිමි අංකයට හෝ පිළිතුරේ කොටසකට හෝ යටින් ඉරක් ඇඳ ඇති විට හෝ රවුම් කර හෝ සලකුණු කර නිශ්චිතව දක්වා ඇති විට එය නිවැරදි පිළිතුරක් ලෙස සලකන්න. **පිළිතුර ලියා තිබීම නිවැරදි සේ නොසැලකේ.**

## I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | පිළිතුර |
|---|---|---|
| 1. | 3 | C සහ E |
| 2. | 1 | 4 |
| 3. | 2 | B |
| 4. | 3 | B සහ D |
| 5. | 3 | ලේන්සුව |
| 6. | 3 | පරණගම, මහරගම, කතරගම |
| 7. | 1 |  |
| 8. | 1 | අමල් |
| 9. | 2 | 10 |
| 10. | 2 | 14 |
| 11. | 1 | 450g, 550g, 500g |
| 12. | 2 | ②, ④, ⑤, ⑦ |
| 13. | 1 | පෙ.ව. 7.18 |
| 14. | 2 | 8 |
| 15. | 2 | හතරක |
| 16. | 1 | හරියටම දෙගුණයකි |
| 17. | 1 | බදාදා |
| 18. | 2 | 5 |
| 19. | 1 | 2 |

Past Papers Wiki



<table>
<tr><td>20.</td><td>1</td><td>පළමුවන පේළියේ</td></tr>
<tr><td>21.</td><td>3</td><td>17, 5 සහ 4 කි</td></tr>
<tr><td>22.</td><td>1</td><td>ආස්මී</td></tr>
<tr><td>23.</td><td>3</td><td>b, e, a, c, d</td></tr>
<tr><td>24.</td><td>2</td><td>B, D, C, A</td></tr>
<tr><td>25.</td><td>1</td><td></td></tr>
<tr><td>26.</td><td>3</td><td>A ගෙන් සංඛ්‍යා දෙකක් B ට ද B ගෙන් එක් සංඛයාවක් A ට ද දීමයි</td></tr>
<tr><td>27.</td><td>2</td><td>පස්වැනි</td></tr>
<tr><td>28.</td><td>2</td><td>708</td></tr>
<tr><td>29.</td><td>2</td><td>සමචතුරස්‍ර 2 හා ත්‍රිකෝණ 3</td></tr>
<tr><td>30.</td><td>3</td><td>C</td></tr>
<tr><td>31.</td><td>1</td><td>නගරය දෙසින් පැමිණ ඇත්තේ වාහන තුනක් පමණි</td></tr>
<tr><td>32.</td><td>3</td><td>3 සහ 3 කි</td></tr>
<tr><td>33.</td><td>3</td><td>ජයලාල් මහතා චාරිකාවේ සැලසුම වෙනස් කලේ සුළි කුණාටුව නිසාය</td></tr>
<tr><td>34.</td><td>2</td><td>100g</td></tr>
<tr><td>35.</td><td>3</td><td>8</td></tr>
<tr><td>36.</td><td>3</td><td><table><tr><td></td><td>5</td><td>8</td></tr><tr><td>8</td><td>4</td><td>5</td></tr><tr><td>4</td><td>7</td><td>6</td></tr></table></td></tr>
<tr><td>37.</td><td>1</td><td>9 සහ 16 වේ</td></tr>
<tr><td>38.</td><td>2</td><td>27</td></tr>
<tr><td>39.</td><td>2</td><td>18</td></tr>
<tr><td>40.</td><td>3</td><td>අමල්, සුනිල්</td></tr>
</table>

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2025

## I පත්‍රය

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

**1. උත්තර පත්‍ර ලකුණු කිරීමේදී සැලකිය යුතු කරුණු**

1.1 සෑම ප්‍රශ්නයක ම නිවැරදි ප්‍රතිචාරයක් සඳහා "✓" ලකුණ ද, වැරදි ප්‍රතිචාරයක් සඳහා "×" ලකුණ ද, පිටුවෙහි ප්‍රධාන කොටුවෙන් පිටත දකුණුපස තීරයෙහි පැහැදිලි ව සටහන් කරන්න.

1.2 එක් එක් පිටුවේ නිවැරදි පිළිතුරු සඳහා වූ "✓" ලකුණුවල එකතුව එම පිටුවේ දකුණුපස පහළ කෙළවරේ ඇති **කොටුව තුළ අංක දෙකකින් සටහන් කරන්න.**

1.3 එක් එක් පිටුවේ සටහන් කළ "✓" ලකුණුවල එකතුව, මුල් පිටුවේ 'ලැබූ ලකුණු' යටතේ අදාළ පිටු අංකයට ඉදිරියෙන් ඇති කොටුව තුළ සටහන් කරන්න. ඉන්පසු එම ලකුණුවල එකතුව ඉලක්කමෙන් සහ අකුරෙන් අදාළ කොටු තුළ ලියන්න.

1.4 **යම්කිසි ප්‍රශ්නයකට පිළිතුරු දී නොමැති විට වරණ තුනම යටින් රතුපාටින් ඉරි ඇඳ වැරදි "×" ලකුණ යොදන්න.**

1.5 උත්තර පත්‍ර ඇගයීම් කළ පරීක්ෂකවරුන් දෙදෙනාත් ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂකවරයාත් තමා විසින් කළ පරීක්ෂා නිවැරදි බවට තම අත්සන හා සංකේත අංකය යොදා සහතික කළ යුතුයි.

**2. ලකුණු ලැයිස්තු සකස් කිරීමේදී සැලකිය යුතු කරුණු**

2.1 ලකුණු ලැයිස්තුවේ "Total marks" තීරය ලකුණු ඇතුළත් කිරීම සඳහා භාවිත කරන්න.

2.2 එම තීරයේ එක් එක් අපේක්ෂකයාගේ විභාග අංකය ඉදිරියෙන්, ඊට නියමිත උත්තර පත්‍රයේ සඳහන් අවසාන ලකුණ ඉලක්කමෙන් සටහන් කරන්න.

2.3 එම අවසාන ලකුණ ඊට ඉදිරියෙන් ඇති "Marks in Words" තීරයේ පැහැදිලි අකුරෙන් ලියන්න.

2.4 ලකුණු ලැයිස්තුව සකස් කිරීමේදී යම් වරදක් සිදුවුවහොත්, එය පැහැදිලි ව **තනි ඉරකින් කපා** නැවත නිවැරදිව ලියා, ලකුණු ඇතුළත් කළ හා පරීක්ෂා කළ පරීක්ෂකවරුන් දෙදෙනාගේ කෙටි අත්සන් යොදන්න.

2.5 කිසියම් සංශෝධනයක් කරනු ලැබුවහොත්, පළමුවන හා දෙවන පරීක්ෂකවරුන්ගේ කෙටි අත්සන් යොදා එය සනාථ කරන්න.

2.6 සංශෝධනයක් කරනු ලබන සෑම අවස්ථාවකදී ම ලකුණු ලැයිස්තුවත් පිළිතුරු පත්‍රයත් ප්‍රධාන පරීක්ෂකට පෙන්වා ඔහුගේ/ඇයගේ අත්සන ද ලබා ගන්න.

2.7 සෑම සංශෝධනයක් ම, ලකුණු ලැයිස්තුවේ පසුපිටෙහි "වෙනත් කරුණු" සඳහා වෙන් ව ඇති ස්ථානයේ ද සටහන් කර පරීක්ෂකවරුන් දෙදෙනාගේ ම සම්පූර්ණ අත්සන් යොදන්න.

2.8 සෑම ලකුණු ලැයිස්තුවක් ම ලකුණු ඇතුළත් කළ, ලකුණු පරීක්ෂා කළ සහ ඇගයීම් ලකුණු තහවුරු කළ (EMF) පරීක්ෂකවරුන් හා ප්‍රධාන පරීක්ෂක විසින් ස්වකීය සංකේත අංක සහ අත්සන් යොදා සහතික කර තිබීම අනිවාර්ය වේ.

Past Papers Wiki

0130

රහස්‍ය ලේඛනයකි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව


# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය


**2025**

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රය








සියලු ම හිමිකම් ඇවිරිණි.

සංශෝධනවලට යටත් ය.

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2025

## II පත්‍රය

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

### 1. උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී සැලකිය යුතු කරුණු

1.1 සෑම ප්‍රශ්නයක ම නිවැරදි ප්‍රතිචාරයක් සඳහා **"✓"** හෝ වැරදි ප්‍රතිචාරයක් සඳහා **"✗"** හෝ කොටුවේ දකුණු පස රේඛාවේ ආසන්නයෙන් ලකුණු කරන්න. එයට හිමි ලකුණ "01 හෝ 02 හෝ 00" හෝ පිටුවේ ප්‍රධාන කොටුවේ දකුණු පස රේඛාවෙන් පිටත තීරුවේ පැහැදිලිව සටහන් කරන්න.

1.2 එක් එක් පිටුවේ නිවැරදි පිළිතුරු සඳහා වූ ලකුණුවල එකතුව එම පිටුවේ දකුණුපස පහළ කෙළවරේ ඇති **කොටුව තුළ අංක දෙකකින් සටහන් කරන්න.**

1.3 එක් එක් පිටුවේ සටහන් කළ ලකුණුවල එකතුව මුල් පිටුවේ අදාළ පිටු අංකයට ඉදිරියෙන් ඇති කොටුව තුළ සටහන් කරන්න.

1.4 සමස්ත උත්තර පත්‍රය සලකා අත්අකුරු සහ ඉලක්කම් පැහැදිලි ව සහ නිවැරදි ව ලියා ඇත්නම් අමතර ලකුණු **දෙකක්** ප්‍රදානය කරන්න. එසේ ම අත්අකුරු **අපැහැදිලි** තත්ත්වයකින් තිබුණත් නිවැරදි ව ලියා ඇත්නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න. එම ලකුණු + 02 හෝ + 01 හෝ **+ 00** ලෙස පිටු අංක 8හි ලියා ඇති මුළු ලකුණ ඉදිරියෙන් **+** ලකුණ යොදා ඇතුළත් කරන්න. එසේ ම මුල් පිටුවේ අටවන පිටු අංකයට අදාළව ලකුණු සටහන් කර ඇති තැන ද +02 හෝ +01 හෝ **+00** අමතර ලකුණ යොදන්න. (**+02** හෝ **+01** ලෙස ලකුණු **නොදෙන්නේ නම් ලකුණු +00** ලෙස සටහන් කරන්න.)

1.5 සියලු ම ලකුණුවල එකතුව අවසාන ලකුණ යටතේ **ඉලක්කමෙන්** සහ **අකුරෙන්** අදාළ කොටු තුළ ලියන්න.

### 2. ලකුණු දීමේ පටිපාටිය පිළිබඳ කෙටි විස්තරයක්

2.1 ප්‍රශ්න අංක 01 සිට 09 තෙක් සහ 10 සිට 14 තෙක් ප්‍රශ්නවල සියලු ම කොටස්වල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න. 5 වන ප්‍රශ්නයේ I කොටසෙහි පිළිතුරු දෙකම නිවැරදි නම් 01 ලකුණක්ද, II කොටසෙහි පිළිතුරු දෙකම නිවැරදි නම් 01 ලකුණක් ද ප්‍රදානය කරන්න.

2.2 ප්‍රශ්න අංක 15 සිට 29 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සඳහන් වේ නම් ලකුණු **02** බැගින් ප්‍රදානය කරන්න.

2.3 ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු **01** බැගින් ප්‍රදානය කරන්න.

2.4 ප්‍රශ්න අංක 60 (වගන්ති) සඳහා එක් වගන්තියකට ලකුණු **02** බැගින් ප්‍රදානය කරන්න.

2.5 ප්‍රශ්න අංක 01 සිට 09 තෙක් (ප්‍රශ්න අංක **02** සහ **08** හැර) සහ 60 පිළිතුරුවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව තිබිය යුතුයි.

2.6 ප්‍රශ්න අංක 10 පිළිතුරුවල සියලු ම අකුරු නිවැරදි විය යුතුයි. ඉංග්‍රීසි වචනවල කැපිටල් සිම්පල් මිශ්‍ර ව ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.

2.7 11 වන ප්‍රශ්නය බලා ලිවීමක් නිසා ඒවා ලිවීමේදී අකුරු නිවැරදිවත්, වාක්‍යය දෙකේ ම ආරම්භක අකුර කැපිටල් අකුරු ලෙස ලිවිය යුතු වේ. අනෙක් අකුරු සිම්පල් ලෙස ලිවීම අවශ්‍ය වේ.

2.8 නිවැරදි පිළිතුර යටින් ඉරක් ඇඳීමට උපදෙස් ලබා දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර කෙසේ හෝ සලකුණු කර තිබේ නම් එම පිළිතුර නිවැරදි සේ සලකන්න. පිළිතුර නැවත ලියා ඇත්නම් එය වැරදිය.

## 3. ලකුණු ලැයිස්තු සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු

3.1 ලකුණු ලැයිස්තුවේ "Total marks" තීරුව, ලකුණු ඇතුළත් කිරීම සඳහා භාවිත කරන්න.

3.2 එම තීරුවේ එක් එක් අපේක්ෂකයාගේ විභාග අංකය ඉදිරියේ, ඊට නියමිත උත්තර පත්‍රයේ සඳහන් අවසාන ලකුණ සටහන් කරන්න.

3.3 අවසාන ලකුණ ඉදිරියෙන් එය **අකුරෙන් පැහැදිලි ව** ලියන්න.

3.4 ලකුණු ලැයිස්තුව සකස් කිරීමේ දී යම් වරදක් සිදු වුවහොත්, එය පැහැදිලි ව **තනි ඉරකින් කපා** නැවත ලියා ලකුණු ඇතුළත් කළ හා පරීක්ෂා කළ පරීක්ෂකවරුන් දෙදෙනාගේ කෙටි අත්සන් යොදන්න.

3.5 කිසියම් සංශෝධනයක් කරනු ලැබුවහොත්, පළමුවැනි පරීක්ෂක හා දෙවැනි පරීක්ෂක කෙටි අත්සන් යොදා එය සනාථ කරන්න.

3.6 සංශෝධනයක් කරනු ලබන සෑම අවස්ථාවක දී ම ලකුණු ලැයිස්තුවත් පිළිතුරු පත්‍රයත් ප්‍රධාන පරීක්ෂකට පෙන්වා ඔහුගේ/ඇයගේ අත්සන ද ලබා ගන්න.

3.7 සෑම සංශෝධනයක් ම, ලකුණු ලැයිස්තුවේ පසුපිටෙහි "වෙනත් කරුණු" සඳහා වෙන් ව ඇති ස්ථානයේ ද සටහන් කර පරීක්ෂකවරුන් දෙදෙනාගේ ම සම්පූර්ණ අත්සන් යොදන්න.

3.8 සෑම ලකුණු ලැයිස්තුවක් ම ලකුණු ඇතුළත් කළ පරීක්ෂක, පරීක්ෂා කළ පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කළ පරීක්ෂක (EMF) සහ ප්‍රධාන පරීක්ෂක විසින් ස්වකීය සංකේත අංක සහ අත්සන් යොදා සහතික කර තිබීම අනිවාර්ය වේ.

**උත්තර පත්‍ර ලකුණු කිරීමේ දීත් ලකුණු ලැයිස්තු පිළියෙල කිරීමේ දීත් පිරිසිදු ව, පැහැදිලි ලෙස, සම්මත ආකාරයට කටයුතු කිරීමට සැලකිලිමත් විය යුතු ය.**


**උත්තර පත්‍රයක හෝ ලකුණු ලැයිස්තුවක හෝ යම් වෙනසක් සිදු කරන්නේ නම් එය පළමු පරීක්ෂක විසින් ම සිදු කළ යුතු ය. එනමුත් ඒ සියල්ල ප්‍රධාන පරීක්ෂකගේ අනුමැතිය ඇති ව කළ බවට ප්‍රධාන පරීක්ෂකගේ අත්සන ද යෙදිය යුතු අතර ගණිත පරීක්ෂක හා උත්තර පත්‍රය පරීක්ෂා කළ දෙවැනි පරීක්ෂකගේ ද කෙටි අත්සන යෙදිය යුතු ය.**

# II පත්‍රය

## ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ලකුණු |
|---|---|---|
| 1. | (i) කන්දේගෙදර ප්‍රාථමික විද්‍යාලය/ කන්දේගෙදර ප්‍රාථමික විදුහල/ කන්දේගෙදර ප්‍රාථමික පාසල | 01 |
| | (ii) තිසරු/ පාසලෙන් අස් වී ගොස් ඇති තිසරු | 01 |
| | (iii) තුන ශ්‍රේණියේ/ 3 ශ්‍රේණිය | 01 |
| | (iv) ලෝක සිතියමක් සහ ශ්‍රී ලංකා සිතියමක්/ ශ්‍රී ලංකා සිතියමක් සහ ලෝක සිතියමක්/ ලෝක සිතියමක් ශ්‍රී ලංකා සිතියමක්<br>ලෝක සිතියමක් සහ ශ්‍රී ලංකා සිතියමක් ඇඳීම යන්නයි/ ඇඳීමටයි | 01 |
| | (v) මෙම අදහස විදුහල්පතිතුමාට දන්වා අවසර ලබාගත යුතු බව/ සිසුන් දුන් අදහස විදුහල්පතිතුමාට දන්වා අවසර ලබාගත යුතු බව | 01 |
| | (vi) අලුත් | 01 |
| | (vii) මල් | 01 |
| 2. | (i) පෙන්නුවෝය<br>(ii) යයි<br>(iii) බොති<br>(iv) ගියේය<br>(v) කළෝය | 01<br>01<br>01<br>01<br>01 |
| 3. | (i) රුවන් ක්‍රීඩා පිටියට පැමිණියේය<br>(ii) මම පේරාදෙණිය මල්වත්ත නැරඹීමට ගියෙමි | 01<br>01 |
| 4. | (i) ස්ථානීය නාම/ ස්ථාන නාම පද/ ස්ථාන<br>(ii) ද්‍රව්‍ය නාම/ ද්‍රව්‍ය නාම පද/ ද්‍රව්‍ය | 01<br>01 |
| 5. | (i). වෛද්‍යවරිය, පරීක්ෂා, පරීක්ෂා<br>(ii). දේශනය, ප්‍රයෝජනවත්<br>පිළිතුරු දෙක මාරු කර නිවැරදිව ලියා තිබීම නිවැරදි සේ සලකන්න | 01<br>01 |
| 6. | (i). ගෙවල් • දොරවල්<br>(ii). වතු • පිටි | 01<br>01 |
| 7. | (i). වැටුණෝය<br>(ii). අනුභව කරමි | 01<br>01 |
| 8. | මෙම පොතෙහි ප්‍රශ්න කිහිපයක් සඳහන් වේ. ඔබපිටු අංක 05 හි තිබෙන ප්‍රශ්න කියෙව්වෙහිද? මෙම විරාම ලකුණු දෙක පමණක් තිබීම අවශ්‍ය වේ. | 01 |
| 9. | කාලගුණය පිළිබඳ වාර්තාව සැමට ඉතා ප්‍රයෝජනවත් වේ./ සැමට කාලගුණය පිළිබඳ වාර්තාව ඉතා ප්‍රයෝජනවත් වේ. | 01 |
| 10. | (i) K n i f e<br>(ii) F i s h<br>කැපිටල්, සිම්පල් මිශ්‍රව ලියා තිබුණද ලකුණු ලබා දෙන්න. | 01<br>01 |

| | | |
|---|---|---|
| 11. | (i). Farmer works in the paddy field<br>(ii). I come to school by bicycle | 01<br>01 |
| 12. | ගඟ/ ගංගාව/ නදිය<br>ජාතික ගීය | 01<br>01 |
| 13. | ශිෂ්‍යයාව/ සිසුවිය / ශිෂ්‍යා | 01 |
| 14. | කිළි පච්චෙයි තිරම් | 01 |
| 15. | තුන් දහස් හැට අට/ තුන් දාස් හැට අට | 02 |
| 16. | 24375, 24537, 24735 | 02 |
| 17. | $\frac{7}{10}$ | 02 |
| 18. | 3573 | 02 |
| 19. | 81, 243 (එක් පිළිතුරක් පමණක් නිවැරදි ස්ථානයේ තිබේ නම් එක් ලකුණක් ලබා දෙන්න) | 02 |
| 20. | 250 | 02 |
| 21. | 5 45 අකුරෙන් ලියා තිබුණද ලකුණු ලබාදෙන්න. | 02 |
| 22. | 106/ එකසිය හය | 02 |
| 23. | 21 250 | 02 |
| 24. | 12/ දොළහයි | 02 |
| 25. | 1 25 | 02 |
| 26. | රුපියල් 930/ රු. 930/ රුපියල් 930.00/ රු. 930.00 | 02 |
| 27. | රුපියල් 205/ රු. 205/ රුපියල් 205.00/ රු. 205.00 | 02 |
| 28. | 3 850 | 02 |
| 29. | (i). 1/ එකයි<br>(ii). 13/ දහතුනයි | 01<br>01 |
| 30. | (1) සමන්පිච්ච ය. | 01 |
| 31. | (2) 5 කි. | 01 |
| 32. | (2) මීයා, ලේනා | 01 |
| 33. | (1) කොහොඹ. | 01 |
| 34. | (3) එස්. මහින්ද හිමි. | 01 |
| 35. | (2) හාතාවාරිය, ගොටුකොළ, වැල්පෙනෙල | 01 |
| 36. | (2) යකඩ කුඩු සහ වැලි | 01 |
| 37. | (1) රතු | 01 |

| | | |
|---|---|---|
| 38. | (2) සියල්ලම පෞද්ගලිකව පරිහරණය කළ යුතු දේ ය. | 01 |
| 39. | (1) වාෂ්ප පිටවේ | 01 |
| 40. | (3) පොරපොල් ගැසීම | 01 |
| 41. | (3) ශ්‍රී ලංකා පොලීසිය සහ රතු කුරුස සංවිධානයයි. | 01 |
| 42. | (1) A හා B | 01 |
| 43. | (3) දුරකථන ඇමතුමක් ලබා දීම | 01 |
| 44. | (2) මේරූ බීජ පැළවීමේදී අවශ්‍ය පෝෂණය ලබා දීමයි. | 01 |
| 45. | (1) A | 01 |
| 46. | (3) වෙරළ ආශ්‍රිත වගුරු බිම්වල වැඩි වශයෙන් වැවෙන ශාක වේ. | 01 |
| 47. | (1) බස් රථ තුළ අධික ශබ්දයෙන් ගීත ප්‍රචාරය කිරීම | 01 |
| 48. | (3) පිරිසිදු ජලයට නිශ්චිත පරිමාවක් ඇත. | 01 |
| 49. | (2) මුහුදේ ගිලී තිබූ මට්ටමට වඩා තරමක් පහළට ගිලෙයි. | 01 |
| 50. | (3) දම්වැල් මැස්ම | 01 |
| 51. | (2) හීං බෝවිටියා | 01 |
| 52. | (1) පත්‍රවලින් ජලය වාෂ්පවීම අඩුකර ගැනීමට | 01 |
| 53. | (2) රෝග වාහක මදුරුවන් දෂ්ට කිරීමෙනි. | 01 |
| 54. | (3) තමන්ට අවශය ප්‍රමාණයට වඩා ආහාර බෙදා ගැනීම | 01 |
| 55. | (3) අහසේ පායන දේදුන්නක තිබෙන විවිධ වර්ණ හඳුනා ගැනීම | 01 |
| 56. | (1)  | 01 |
| 57. | (2) ගස්ලබු | 01 |
| 58. | (3) ගුල්ලන් සිටීම | 01 |
| 59. | (1) 119 | 01 |
| 60. | **නිවැරදි වාක්‍ය 03**<br>වගන්ති සඳහා උපදෙස්<br>(i) නිවැරදි වාක්‍ය තුනට **ලකුණු 02 බැගින් (02 x 3) ලකුණු 06** ක් ලබා දෙන්න<br>(ii) සෑම වාක්‍යයක්ම වචන පහකට (05) නොඅඩු විය යුතුය.<br>(iii) උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය.<br>(iv) අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.<br>(v) මාතෘකාවට අදාළ විය යුතුය.<br>(vi) ලිඛිත භාෂාවෙන් ලියන ලද වැකි විය යුතුය.<br>(vii) වැකියේ අදහස නිවැරදි විය යුතුය.<br>(viii) එක ම අදහස නැවත නැවත ලිවීම සිදු වී ඇත්නම් **ලකුණු නොලැබේ.**<br>(ix) වගන්ති අතීත කාලයෙන් විය යුතුය.<br>• වැකියේ එක් වචනයක අකුරක අඩුපාඩුවක් හෝ පිල්ලමක අඩුවක් හෝ වේ නම් ලකුණු 01කි.<br>අඩුපාඩු එකකට වැඩි නම් ලකුණු නොලැබේ. | |



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## සිසුන් විසින් ලියා ඇති වාක්‍ය

1. තරගයට සහභාගී වීම සඳහා අයියා ඉක්මනින් ම ආරම්භක ස්ථානය වෙත පැමිණෙන අයුරු මම දුටුවෙමි.
2. ආරම්භක සංඥාව ඇසීමත් සමග අයියා දිවීම ආරම්භ කරන අයුරු මම දුටුවෙමි.
3. තරගකරුවන් පසුකරමින් අයියා ඉදිරියට දිව යන ආකාරය දැක මම සතුටු වුණෙමි.
4. අයියාගේ නම කියමින් යහළුවන් කෑගසන අයුරු මට පෙනුණි.
5. තරගය ආරම්භවීමත් සමග අම්මා සහ තාත්තා ද පැමිණ සිටි අයුරු මම දුටුවෙමි.
6. තරගයට සියල්ල සූදානම්ව තිබියදී තද වැස්සකින් ක්‍රීඩා පිටිය ජලයෙන් පිරී ගියේය.
7. අයියා තරගයේ ප්‍රථම ස්ථානය ජයග්‍රහණය කිරීමත් සමග යහළුවන් ප්‍රීති ඝෝෂා කරන අයුරු මට පෙනුණි.
8. තරගකරුවන් අතර අයියා ද දිවීමට සූදානම් වන අයුරු මම දුටුවෙමි.
9. බිම වැටුණු අයියාව ප්‍රථමාධාර දීම සඳහා යහළුවන් රැගෙන අයුරු මම දුටුවෙමි.
10. ප්‍රථම ස්ථානය ජයග්‍රහණය කළ අයියා යහළුවන් විසින් ඔසවා ගෙන පිටිය වටා කෑ ගසමින් යන අයුරු මම දුටුවෙමි.

ඇමුණුම 01

**සිසුන් විසින් ලියා ඇති වාක්‍ය**

1. තරගයේ නම කියවූ සැණින් මම පිටිය පුරා අයියාවූ සෙව්වෙමි.
2. අයියා සපත්තු දමමින් තරගයට සූදානම් වන අයුරු මම දුටුවෙමි.
3. අයියා තරගයට සූදානම්වන අයුරු මම බලා සිටියෙමි.
4. අයියා තරගය දිනනවා යැයි මම ප්‍රාර්ථනා කරන්නෙමි.
5. මම අයියාට ඔල්වරසන් දීමට පිටිය අසලින් ම රැඳී සිටියෙමි.
6. අයියා කුමන මංතීරුවේ තරග කරන්නේ දැයි මම විමසිලිමත් වුනෙමි.
7. අයියා තරගකරුවන් සමග කරට කර තරග වැදුණි.
8. තරගය ආරම්භවත්ම හදිසියේම වැහි වලාකුළුවලින් පිටිය අඳුරු විය.
9. තරගයට පෙර මම වේගයෙන් දිවගොස් අයියාට ග්ලූකෝස් කැව්වෙමි.
10. බලාපොරොත්තු නොවූ වේලාවක තද සුළඟක් හමා පිටිය දූහුවිල්ලෙන් වැසුණි.
11. අයියා තරගයට සහභාගීවන බව මම සිතමි.
12. සියලුදෙනා "හුරේ... හුරේ.." කියා කෑගැසුවෝය.
13. දුවන අතරේ අයියා පිටියේ ඇඳවැටුණි.
14. මීටර් සියය දිවීමේ තරගයෙන් අයියා ප්‍රථම ස්ථානය ලබා ගත්තේය.
15. තරගයේ ආරම්භයත් සමග අයියාගේ නම කියැවෙන විට මගේ ඇඟේ හිරිගඩු පිපුණි.
16. අයියා වැටුණු පසු ගුරුවරයෙකු පැමිණ නැගිට්ටුවේය.
17. අයියා මට සංග්‍රාවක් දෙයි යැයි මම සිතන්නෙමි.
18. මීටර් 100 දිවීමේ තරගයේ අනෙක් තරගකරුවන් පසුකර අයියා ඉදිරියට ම ඇදුණේය.
19. සුනිමල් තරගයේ පළවෙනියා වී ජයගත්තේය.
20. යාළුවන් අයියාගේ නම කියා කෑගසති.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



## පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට
## පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2025

### II පත්‍රය

- පහත දැක්වෙන ප්‍රශ්න අංකවල පිළිතුරු සංශෝධනය කරන ලදී.

| ප්‍රශ්න අංකය | පිළිතුරු | | ලකුණු |
|---|---|---|---|
| 1. | iii. තුන ශ්‍රේණියේ/ 3 ශ්‍රේණිය/ තුන/ 3/ තුන්වන ශ්‍රේණිය/ තෙවන ශ්‍රේණියේ | | 01 |
| 3. | (i) රුවන් ක්‍රීඩා පිටියට උදෙන් ම පැමිණියේය<br>(ii) මම පේරාදෙණිය මල්වත්ත නැරඹීමට ගියෙමි | | 01<br>01 |
| 4. | (i) ස්ථානීය නාම/ ස්ථාන නාම පදය/ ස්ථාන<br>(ii) ද්‍රව්‍ය නාම/ ද්‍රව්‍ය නාම පදය/ ද්‍රව්‍ය | පදයක්/ පදයකි | 01<br>01 |
| 6. | (i). ගෙවල් දොරවල්<br>(ii).වතු පිටි | | 01<br>01 |
| 7. | (i). වැටුණෝ ය | | 01 |
| 13. | ශිෂ්‍යයාව/ සිසුවිය/ ශිෂ්‍යාව | | 01 |
| 14. | කිළි පච්චෙයි/ පච්චෙ නිරම් | | |
| 26. | රුපියල් 930/= රු.930/= රුපියල් 930.00 රු. 930.00<br>රුපියල් 930 රු. 930 | • අකුරෙන් ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.<br>• රු (තිත නොමැතිව නිවැරදි පිළිතුරට ලකුණු 01 | 02 |
| 27. | රුපියල් 205/= රු.205/= රුපියල් 205.00<br>රු. 205.00 රුපියල් 205 රු. 205 | | 02 |

<u>**සිසුන් විසින් ලියා ඇති වාක්‍ය**</u>

9. බිම වැටුණු අයියාව ප්‍රථමාධාර දීම සඳහා යහළුවන් රැගෙන යන අයුරු මම දුටුවෙමි.

- එම සංශෝධන ඔබගේ ලකුණු දීමේ පටිපාටියේ සංශෝධනය කර ප්‍රධාන පරීක්ෂක ලවා අත්සන් ලබා ගන්න.
- අධීක්ෂණයේ දී එය පරීක්ෂා කරනු ඇත.